## ව්‍යාපාර නාම ලියාපදිංචියට උපදෙස්

1. ලියාපදිංචි කිරීමට අදාල ඉල්ලුම් පත්‍රය ගාස්තු ගෙවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගන්න

2. ඉල්ලුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර අත්සන් තබා පහත සඳහන් ලියවිලි සමඟ ව්‍යාපාරය පිහිටි වසමේ ග්‍රාම නිලධාරි මහතා වෙත ඉදිරිපත් කරන්න.

- ඉල්ලුම්කරු/ඉල්ලුම්කරුවන්ගේ ජාතික හැඳුනුම්පත් සමඟින් එහි ඡායා පිටපත
- ව්‍යාපාරික ස්ථානයට අදාල නීත්‍යානුකූල ලියවිලි සමඟ එහි ඡායා පිටපත
- ව්‍යාපාරික ස්ථානය ඉල්ලුම්කරු සතු නොවේ නම් හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය / දිව්රුම් ප්‍රකාශය
- ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යාම වෙනුවෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට බලපත්‍ර ගාස්තු ගෙවූ බවට නිකුත් කරන ලදුපත හා එහි පිටපතක්
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට ව්‍යාපාරික ස්ථානයට පැමිණිය හැකි මාර්ගය පිළිබඳ දළ සටහනක්
- ව්‍යාපාර ස්වභාවය අනුව අවශ්‍ය වන වෙනත් වාර්තා හා එහි ඡායා පිටපත්

## සටහන

- ව්‍යාපාරය ආරම්භ කර දින 14 ක් ඇතුළත අදාල ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කල යුතු අතර ව්‍යාපාරයේ ගොඩනැඟිල්ල සමඟ වටිනාකම අනුව ලියාපදිංචි ගාස්තු අයකරනු ලබයි.
- ප්‍රමාද වී ලියාපදිංචිය ඉල්ලුම් කිරීමේදි ප්‍රමාද ගාස්තු අය කිරීමට සිදු වේ.
- ඉහත සඳහන් සියළු ලේඛන සමඟ වෙනත් ආයතනවලින් නිර්දේශයන් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් එම නිර්දේශය ලබා ගැනීමෙන් සහ මෙම කාර්යාලයේ ක්ෂේත්‍ර සංවර්ධන සහකාර නිලධාරිගේ පරීක්ෂාවෙන් පසු ව්‍යාපාරය ලියාපදිංචි කරනු ඇත.

## ව්‍යාපාර නාම සංශෝධනයක් සිදු කිරීමේදී,

### අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතු ලියවිලි

- ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත
- ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සිට ව්‍යාපාරික ස්ථානයට පැමිණිය හැකි මාර්ගය පිළිබඳ දළ සටහනක්

- ව්‍යාපාරික ස්ථානය පවත්වාගෙන යාම වෙනුවෙන් ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට බලපත්‍ර ගාස්තු ගෙවූ බවට නිකුත් කරන ලදුපත (පිටපතක් ඉදිරිපත් කරන්නේ නම් ග්‍රාම නිලධාරි විසින් සහතික කළ යුතුය)
- හවුල් කරුවෙකු බඳවා ගන්නේ නම් අදාල පුද්ගලයාගේ ජා.හැ.පිටපතක් ග්‍රාම නිලධාරි විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය
- ව්‍යාපාරික ලිපිනය සංශෝධනය කරන්නේ නම් එම ස්ථානයට අදාල අයිතිය තහවුරු කරන ලියවිලි (ඔප්පුව/බදු ඔප්පුව) වල පිටපත් ග්‍රාම නිලධාරි විසින් සහතික කර ඉදිරිපත් කල යුතුය
- ඉඩම වෙනත් අයකු සතු වේ නම් සහතික කරන ලද අදාල ඔප්පු පිටපත සමඟ ග්‍රාම නිලධාරි ඉදිරියේ ලියා අත්සන් කරන ලද හිමිකරුගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය ඉදිරිපත් කළ යුතුය

**<u>සටහන</u>**

- ව්‍යාපාරය සංශෝධනය කර දින 14 ක් ඇතුළත අදාල සංශෝධනය සඳහා ඉල්ලුම් කල යුතු අතර ව්‍යාපාරයේ ගොඩනැගිල්ල සමඟ වටිනාකම අනුව සංශෝධන ගාස්තු අයකරනු ලබයි.
- ප්‍රමාද වූ සංශෝධන ඉල්ලුම් කිරීමේදි ප්‍රමාද ගාස්තු අය කිරීමට සිදු වේ.
- ඉහත සඳහන් සියළු ලේඛන සමඟ වෙනත් ආයතනවලින් නිර්දේශයන් ලබා ගැනීමට අවශ්‍ය වේ නම් එම නිර්දේශය ලබා ගැනීමෙන් සහ මෙම කාර්යාලයේ ක්ෂේත්‍ර සංවර්ධන සහකාර නිලධාරිගේ පරීක්ෂාවෙන් පසු ව්‍යාපාරය සංශෝධනය කරනු ඇත.